# ඇටන්වල ග්‍රාමය පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

පී.ඩී.ඒ.කේ. පරණගම

පාරිසරික කළමනාකරණ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය,
akparanagama1998@gmail.com

**මුඛ්‍ය පද** - ඇටන්වල ගම, මානව විද්‍යාව, නවීකරණය, පර්යේෂණය

## හැඳින්වීම

අතීතය, වර්තමානය හා අනාගතය යන තුන් කාලයේ ම සමාජය සඳහා පදනම සකස් වූයේ ගම නම් වූ කුඩාම සමාජ ඒකකය මතය. ගැමි සමාජ පිළිබඳව අධ්‍යයනය කිරීම මානව විද්‍යාවේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රයකි. පුරාණ ලෝකයේ ගම සංවිධානය වීම ක්‍රි.පූ. 6000කට එපිට සිදු වූ බව මානව වංශ පුරාවිද්‍යාඥයින් පිළිගනු ලබයි. ගැමි ජන ජීවිතයේ සමාජ, ආර්ථික, සංස්කෘතික, දේශපාලනික, තාක්ෂණික ඇතුළු සමාජයේ භාවිත වූ විවිධ ද්‍රව්‍යමය අංශ පිළිබඳ තොරතුරු පර්යේෂණය කිරීම මානව විද්‍යාඥයින්ගේ අතින් සිදු වේ. ඒ ඒ සමාජ සිරස් හා තිරස් අතට වර්ගකොට ගමක පවතින සමාජ, ආර්ථික හා දේශපාලනික ව්‍යුහය එබඳු සමාජ අතුරුදන් වීම, නවීකරණය වීමට හා නවීකරණය නොවීමට හේතු සාධක සොයා බලනු ලබයි. ඇටන්වල යන ගම වර්තමානය වන තෙක් ම නවීකරණ සාධක වැළඳ නොගැනීම පිළිබඳ අධ්‍යයනය කිරීම පර්යේෂණයේ කේන්ද්‍රීය ගැටළුව වේ. ඇටන්වල ගම පිළිබඳව මානව විද්‍යාවට අදාළව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන අතර නවීකරණ සාධක ගම තුළ දැකගත හැකි ද යන්න හා නොහැකි ද යන්න සොයා බැලීම හා ඒවාට හේතු විමර්ශනය කිරීම මෙහි අනු අරමුණු ලෙස පෙන්වා දිය හැකිය. ඇටන්වල ගම්මානය තුළ නවීකරණ සාධක මද බවට හේතුව වන්නේ මානව බලපෑම්, පාරිසරික බලපෑම්, සමාජ ආර්ථික බලපෑම් ආදිය ද යන්න සොයා බැලීම මෙම පර්යේෂණයේ උපන්‍යාසය වේ.

## ක්‍රමවේදය

පර්යේෂණය සිදු කිරීමේ දී මිශ්‍ර ක්‍රමය අනුගමනය කිරීමට සෑම අවස්ථාවකම කටයුතු කර ඇත. ප්‍රාථමික දත්ත එක්රැස් කිරීමේ දී සහභාගිත්ව නිරීක්ෂණ, ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා භාවිත කරන ලදී. දත්ත විශ්ලේෂණය කිරීමේදී ගුණාත්මක හා ප්‍රමාණාත්මක යන දෙවර්ගයම භාවිත කර ඇත. ලබාගත් දත්ත විශ්ලේෂණය කර ඉදිරිපත් කිරීම සඳහා පරිච්ඡේද සහ ඡායාරූප, සිතියම්, වගු හෝ ප්‍රස්ථාර ආදී සියලු දත්ත ඉදිරිපත් කිරීමේ මෙවලම් භාවිත කරනු ලබයි. ඉහත සඳහන් කර ඇති ලෙසට මෙම පර්යේෂණය ඇටන්වල නම් ගම තුළ සතියක් පුරාවට සහභාගිත්ව නිරීක්ෂණය මගින් දත්ත එක්රැස් කරමින් පර්යේෂණය පෙළ ගස්වා ඇත.

## ප්‍රතිඵල හා සාකච්චාව

ලෝකයේ ඉතාම පැරණි හා ප්‍රෞඩ ඉතිහාසයක් සහිත ගම නැමැති සමාජ ඒකකයෙහි පරිහානිය සිදු වූයේ ලෝකය තුළ බටහිර සංකල්ප වාදයන් ප්‍රචලිත වීමත් සමඟ යි. විග්‍රහාත්මකව බලන කල සම්ප්‍රදායානුගත ගැමි සමාජ දැන් වෙනස් වී ගෙන යන තත්ත්වයට පැමිණ ඇත. දියුණු වන ලෝකය ඉදිරියේ ගැමි ජනතාවගේ ප්‍රශ්න ව්‍යාප්ත වී තිබෙන බව පෙනේ. ගියර්ට්ස් සඳහන් කරන පරිදි මානව විද්‍යාත්මක ක්ෂේත්‍රය ගැමි සමාජ අධ්‍යයනය කිරීම වැදගත් වී ඇති අතර එය මූලික ප්‍රශ්නයක් ද වී ඇත. ඇටන්වල ගම පිළිබඳව මානව විද්‍යාත්මක අධ්‍යයනයක් කිරීම තුළින් එළඹිය හැකි ප්‍රධානතම නිගමනය වන්නේ ගමට පිවිසීමට ඇති දුෂ්කර මාර්ග හේතුවෙන් නවීකරණ සාධක ගම තුළ දැකගත නොහැකි බවයි. එම හේතුව නිසාවෙන් ඇටන්වල ග්‍රාමයේ ජනතාව බොහොමයක් විශේෂයෙන් තරුණ

ප්‍රජාව ග්‍රාමය අතහැර යන අතර වයසට ගිය වැඩිහිටි ප්‍රජාව පමණක් ගම තුළ වාසය කරනු ලබයි. එම හේතුව මත වැඩිහිටි ප්‍රජාවට එතරම් නවීකරණ සාධක අවශ්‍ය නොමැති නිසාවෙන් ද තරුණ ප්‍රජාව ගමෙහි නොමැති නිසාවෙන් ද ඇටන්වල ග්‍රාමය නවීකරණ සාධක වැළඳ නොගෙන ඇති බව ප්‍රකාශ කළ හැකිය. මෙම පර්යේෂණයේ උපන්‍යාසය ලෙස පෙන්වා දී ඇත්තේ ඇටන්වල ගම්මානය තුළ නවීකරණ සාධක මද බවට හේතුව වන්නේ මානව බලපෑම්, පාරිසරික බලපෑම්, සමාජ ආර්ථික බලපෑම් ආදිය ද යන්න සොයා බැලීම ලෙස ය. පර්යේෂණයෙන් පසුව ලබාගත් සියලු ම සාධක විශ්ලේෂණය කිරීම තුළින් පෙනී ගියේ ගම්මානය තුළ පවතින නවීකරණ සාධකවල මද බවට හේතුව වී ඇත්තේ ඇටන්වල ග්‍රාමයේ පිහිටා ඇති පාරිසරික වටපිටාව හා ආර්ථික බලපෑම් යන්නයි. ඒ අනුව නිසි මාර්ග පහසුකම් සහිතව තිබුයේ නම් මේ ගම්මාන මේ ආකාරයට හුදෙකලා බවට පත් නොවී නවීකරණය වීමට හැකියාවක් ඇති බව මේ මඟින් නිගමනය කළ හැකිය. ගම තුළ සැඟවී ඇති රැකියා අවස්ථා මතු කර ගැනීම තුළින් ගම තුළ ජීවත් වන ප්‍රජාවගේ ආර්ථිකය සාක්ෂාත් කර ගැනීමට තවමත් ඔවුනට හැකියාවක් ඇත. සියළු කරුණු දෙස අවධානය යොමු කිරීමේ දී පෙනී යන්නේ ඇටන්වල ගම නවීකරණ සාධක වැළඳ ගැනීමට අකමැත්තක් නොදක්වන බවත් ඔවුන්ට ඇත්තේ මාර්ගවල පවතින දුෂ්කරතාවයක් පමණක් බව ගම්‍යමාන වේ. පර්යේෂණය සඳහා එක්රැස් කළ දත්ත හා තොරතුරු මත පදනම්ව ප්‍රධාන වශයෙන් ලබාදෙන යෝජනාවක් වන්නේ ගමට ප්‍රවේශ වීමට ඇති මහා මාර්ග නිසි පරිදි සංවර්ධනය කර දීම මගින් මෙකී ගම්මාන නවීකරණ සාධක වැළඳ ගැනීමට ඉඩක් ඇති බව මෙමඟින් පෙන්වා දිය හැක.

**ආශ්‍රිත මූලාශ්‍රය**


ගුණවර්ධන, පී. (2016). ***පුරාණ ගම***, සමන්තී ප්‍රකාශකයෝ.

රත්නපාල, එන්. (2001). ***මානව විද්‍යාව.***

සේනාරත්න, පී.ඇම්. (2013). ***පුරාණ ලංකාවේ ගම්දොර විත්ති,*** සමන්තී ප්‍රකාශකයෝ.